**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 492**
**ආයතනයේ නම : රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**
**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492**
**நிறுவனத்தின் பெயர் : பொது நிர்வாகம், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**
**பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் மீதான குழுவால் தாக்கல் செய்யப்பட்ட அறிக்கைகள் தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ நிறுவனப் பொறுப்பு அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகளை பாராளுமன்றத்துக்கு சமர்ப்பித்தல்**

**Parliamentary Series No: 492**
**Name of the institution: Ministry of Public Administration Provincial councils and Local government**
**Submission of observations of the Hon.Minister in charge of the institutions and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)**

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492
ආයතනයේ නම : රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**පළමු කොටස**

| **කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු** | **ඊට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය** |
|---|---|
| 2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | සිගාස් පද්ධතිය තුළ වායු සමීකරණ යන්ත්‍ර 46ක් ආරම්භක ශේෂයන් ලෙස පවතින අතර එම යන්ත්‍ර සිගාස් පද්ධතිය තුළ වත්කම් ලෙස හඳුනා ගෙන ඇත්තේ 2016/2017/2018 යන වර්ෂයන් වලදීය. නමුත් නිල මැදුර ගොඩනැගිල්ලේ මධ්‍යම වායුසමීකරණ පද්ධතියක් පවතින බැවින් මෙම වායු සමීකරණ යන්ත්‍ර ස්වදේශ කටයුතු අංශයේ භෞතිකව නොමැත. තවද 2016-2018 කාලසීමාව තුළ ස්වදේශ කටයුතු අංශය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගොස් ඇති අතර මේ පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හා සාකච්ඡා කළ පරිදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.<br>සිගාස් පද්ධතිය තුළ අමාත්‍යාංශය සතු වාහන ලෙස වාහන 40ක් ඇතුළත් කර තිබුණද මේ වන විට අමාත්‍යාංශය සතුව පවතින්නේ වාහන 29 ක් පමණ වන අතර ශේෂයට අදාල වෙනස හඳුනා ගනිමින් පවතින අතර හඳුනාගත් පසු ඉදිරියේදී අදාල ගැළපීම් සිදුකරන බව දන්වා සිටිමි.<br>අනෙකුත් ස්ථාවර වත්කම් 2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 8.1 හා 8.2 ප්‍රකාරව යාවත්කාලීන කර ඇත. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | සෑම විගණන හා කළමනාකරණ රැස්වීමකදීම සියළු අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී නියමිත කාල සීමාව තුල පිළිතුරු සපයනු ඇත. |
| අභ්‍යන්තර විගණන වීමසුම් සඳහා මසක් තුළ පිළිතුර නොසැපයූ අවස්ථා වාර්තා විය. | සෑම විගණන හා කළමනාකරණ රැස්වීමකදීම සියළු අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමටත් ඒ අනුව නිශ්චිත කාලය තුල පිළිතුරු සපයන ලෙසත් දැනුවත් කර ඇත. |
| සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | අමාත්‍යාංශය විසින් භාවිතා කරන සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ ඇත. |

| | |
|---|---|
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි | සියළු වාහනවල රාජ්‍ය ලාංජනය ප්‍රදර්ශනය කර ඇත. ඉදිරියේදී රාජ්‍ය ලාංජනය පින්තාරු කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී. |
| වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | මේ වනවිට වෙනත් රාජ්‍ය ආයතනයකට පවරා දී ඇත. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | නිලධාරීන් කිහිප දෙනෙකු කොටස් වශයෙන් වාරික ගෙවීම සිදුකරන අතර නොගෙවන ණය මුදල් සඳහා නීති මඟින් කටයුතු කරමින් පවතී. |

දෙවන කොටස

| කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු | ඊට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය |
| --- | --- |
| ආයතනය පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | පළාත් සභා සහ පළාත් පාලන අංශයේ පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී අධීක්ෂණය කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම යන්න නව ක්‍රියාකාරකමක් ලෙස අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඒ අනුව එහි ප්‍රගතිය ඉදිරියේදී මාසිකව අධීක්ෂණය කරනු ලැබේ. |
| සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(I) අනුව තවදුරටත් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව සඳහන් කර ඇත. |
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය සියයට පනහකට වඩා අඩු මට්ටමක පැවතුණි. | අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි 6 (ඇ) හි සඳහන් විධිවිධාන වලට යටත්ව පුහුණු අවස්ථාවන් ලබා දීමේදී චක්‍රලේඛයේ සඳහන් නිර්නායක යටතේ සම්පූර්ණ කළ යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් අවස්ථාව ලබා දී ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් වල නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතු බැවින් අමාත්‍යාංශයේ විගණන මතය තත්වාගණන මතයකි. මේ වන විට මූල්‍ය නොවන වත්කම් වල නිවැරදි අගය ඇතුලත් කර Cigas දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇත.<br>මේ වන විට විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන ඇත. |

.............................................

මහාචාර්ය ඒ.එච්.එම්.එච් අබයරත්න (පා.ම)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරස්‍රය - කොළඹ 07.